# කැල්ල කුඹල් ගම්මානයේ මෘද් භාණ්ඩ ශිල්පීය විධි පිළිබඳ අධ්‍යයනය

එම්.සී. ප්‍රියදර්ශනි

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.

**ප්‍රමුඛ පද: සකපෝරුව, අඩුක් කිරීම, තට්ටු ක්‍රමය, මෘද් භාණ්ඩ, පස් පිඩ**

## හැඳින්වීම

සතුන්ගේ පා සලකුණු රැඳි කුහර, සතුන් ලැඟි දිය කඩිති ආදිනව මානවයාට බඳුන් තැනීම සඳහා සංකල්ප සැපයී ය. ඒ අනුව මුල් කාලීන මානවයා මැටි භාණ්ඩ තාක්ෂණයේ දී වේ තුඹස්, කුඹල් කුඩු ද පරිසරයේ විවිධ ස්වභාවික වස්තූන් ද අවශ්‍ය ලෙස අතින් හැඩ ගස්වා අව්වේ වියලා මැටි භාණ්ඩ තැනීය. ඔවුහු පසු කාලීනව මැටි භාණ්ඩ ගින්නෙන් දවා ශක්තිමත් කර ගත්හ. නව ශිලා යුගයේ මානවයාගේ මැටි භාණ්ඩ තැනීමේ අත්දැකීම් වෙනස් විය. ඔහුගේ ප්‍රාගුණ්‍ය අවශ්‍යතා අනුව මෙම අත්දැකීම් නව ස්වරූපයක් ගනු ලැබීය. දීර්ඝකාලීන අත් දැකීම්වලින් පසුව අවුරුදු සිය දහස් ගණනකට පසුව කුඹල්සක නිර්මාණයත් සමඟ මැටි භාණ්ඩ තාක්ෂණයේ ස්වභාවය සම්පූර්ණයෙන්ම වෙනස් විය. එහිදී මෘද් භාණ්ඩ ශිල්පීය විධි පිළිබඳ හැදෑරීම අත්‍යවශ්‍ය සාධකයෙකි. මෙම පර්යේෂණයේ දී මාගේ ප්‍රධාන අරමුණ වූයේ කැල්ල කුඹල් ගම්මානය ඇසුරින් මෘද් භාණ්ඩ ශිල්පීය විධි පිළිබඳ අධ්‍යයනය කිරීමයි. කුඹල් ප්‍රජාවගේ ඉපැරණි ගම්මානයක් වන කැල්ල කුඹල් ගම්මානයේ මෘද් භාණ්ඩ ශිල්පීය විධි ක්‍රම 03 ක් යටතේ හඳුනා ගත හැකි විය. එනම්, අමුද්‍රව්‍ය පිළියෙළ කිරීම, වළං හැඩ ගැන්වීම හා වළං පිළිස්සීම යනුවෙනි. ඒ අනුව මෙම මෘද් භාණ්ඩ ශිල්පීය විධි පිළිබඳ අධ්‍යයනය කිරීම ප්‍රධාන අරමුණ විය. මෙහිදී පර්යේෂණ ගැටලුව ලෙස මෘද් භාණ්ඩ ශිල්පීය විධි කෙසේ භාවිත කර ඇද්ද ? එය වර්තමානය වන විට සාම්ප්‍රදායික ද? යන්න අධ්‍යයනය කිරිමට බලාපොරොත්තු වේ.

## ක්‍රමවේදය

කැල්ල කුඹල් ගම්මානය ඇසුරින් මෘද් භාණ්ඩ ශිල්පීය විධි පිළිබඳව හැදෑරීමේ දී අමුද්‍රව්‍ය පිළියෙල කර ගැනීමේ සිට මැටි බඳුන නිර්මාණය කිරීම දක්වා වූ ක්‍රියාවලිය අධ්‍යනය කිරීමට මෙම පර්යේෂණය තුලින් බලාපොරොත්තු වේ. කුඹල් කර්මාන්තය ආශ්‍රිත ශිල්පීය විධි පිළිබඳ අධ්‍යනය කිරීමේ දී එම ක්‍රියාවලිය විශාල පරාසයක් පුරා පැතිරී ඇති බැවින් එම අධ්‍යයන පහසු කර ගැනීම සඳහා තෝරාගත් එක් ප්‍රදේශයක් අධ්‍යයනය කරනු ලැබේ.

මේ සඳහා ප්‍රථමයෙන්ම මූලාශ්‍ර අධ්‍යයනය කර ක්ෂේත්‍රයට පිවිසීමට ප්‍රථම ඒ පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම අනතුරුව මා ක්ෂේත්‍රයට පිවිස ගම්වාසීන් සමඟ සාකච්ඡා කර තොරතුරු ලබා ගැනීමත් සමඟම එය තහවුරු කිරීම පිණිස ඡායාරූප ලබා ගැනීම ද සිදු කරන ලදී.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

ඇඹිලිපිටිය කොළොන්න පාරේ කැල්ල හන්දියෙන් හැරී දෙනියාය දෙසට කිලෝමීටරයක් පමණ ගිය විට මෙම ගම්මානය හමු වේ. කුඹල් ප්‍රජාවගේ ඉපැරණි ගම්මානයක් වන මෙහි දී මෘද් භාණ්ඩ ශිල්පීය විධි ක්‍රම 03 යටතේ හඳුනා ගත හැකි විය. එනම්, අමුද්‍රව්‍ය පිළියෙළ කිරීම, වළං හැඩ ගැන්වීම, වළං

පිළිස්සීම යනුවෙනි. මෘද් භාණ්ඩ නිර්මාණය කිරීම සඳහා අමුද්‍රව්‍ය ලෙස පස් හා වතුර භාවිතා කර මිශ්‍රනයක් නිර්මාණය කර ගැනීමෙන් අනතුරුව මැට්ට පදම් කර එක් තැන් කිරීම සිදු කරනු ලබයි. දින කිහිපයක් ගතවීමෙන් මැටි පදම් වී සියලුම මැටි එක සමාන වේ. පසුව මැට්ටෙහි ගල් කැට ඉවත් කෙරෙයි. මෙම අවස්ථාවේ දී මැට්ට තව දුරටත් සකස් වීම සඳහා භාණ්ඩ ඉරිතැලීමෙන් වැළකීමට සිහින් වැලි මුසු කරයි. අනතුරුව භාණ්ඩ නිමවීමට සකපෝරුව එක් කරනු ලබන අතර එය දෙවන ශිල්පීය විධි ක්‍රමය යි.

සකසන ලද මැටි පිඩ භාණ්ඩයක් බවට පත් වන්නේ අතේ හුරුවෙනි. නූතන සක පෝරුව නව තාක්ෂණික විදුලිය යෙදූ මෙවලමක් බවට පත් විය. එකල සකපෝරුව කවාකාර ලෑල්ලක ගලක හෝ ලී කොටයක් මත සකස් කර තිබිණි. පසුකාලීනව එය අතින් හෝ කර කැවිය හැකි මෙවලමක් විය. තනිවම හෝ අන් අයෙකුගේ සහයෙන් එය කරකැවුණු අතර කුඹලා මානසිකව ගොඩනගන භාණ්ඩය අත හුරුවෙන් නිර්මාණය විය. භාණ්ඩයේ ගැට්ට නිර්මාණය කිරීමෙන් පසුව දවසක් දෙකක් අව්වේ වේලා ගනු ලැබේ. අනතුරුව භාණ්ඩයට අවශ්‍ය හැඩය නිර්මාණය ද, භාණ්ඩයේ පතුල සැකසීම ද, කුහර ඉවත් කිරීම සඳහා ද දැව අත කොලුවේ තලා ගනු ලැබේ. කැටයම් යොදා ගැනීම සඳහා ලී කතුරක් හෝ බට පතුරක් භාවිතා කරයි. වර්ණ ගැන්වීම ද මෙම අවස්ථාවේ දී සිදු කරයි. නිමා කරන ලද වියලුණු භාණ්ඩය පෝරණුවේ දමා පුච්චනු ලැබේ. බොහෝ අවස්ථා වලදී මැටි භාණ්ඩ පිළිස්සූ පසු පින්සලෙන් රතු පාට, සුදු පාට කළු පාට ආදී වර්ණ වලට වයිති කවලම් කර චිත්‍ර අඳින අවස්ථා ද තිබේ.

තෙවන ශිල්පීය විධි ක්‍රමය වළං පිළිස්සීමයි. නිමා කර ගත් මැටි නිර්මාණ වටේට තනන ලද මැට්ටෙන් හෝ ගඩොලින් තැනූ පෝරණුවක පිදුරු අතර තැන්පත් කරයි. පිදුරු අතර තට්ටු ක්‍රමයට අඩුක් කරගත් නිර්මාණ අසරනු ලැබේ. ඇතුලත ගිනි දැල් හා රස්නය ඇතුලත් වීමට කුහර තිබේ. එක පැත්තකින් හෝ පැති කිහිපයකින් පෝරණුවකට ගිනි දැල්වීම සිදු වේ. මැටි භාණ්ඩ තට්ටු ක්‍රමයට තැන්පත් කර අවසානයේ පිදුරු තටටු තබා ඒ මත තෙත් මැටි අතුරයි. පදමට ගිනි දැල්වීමෙන් පසුව ක්‍රමයෙන් ගිනි රස්නයෙන් පෝරණුවේ ගිනි දැල් වේ. දින කිහිපයකින් පසුව රස්නය ඉවත් වූ විට පෝරණුවෙන් භාණ්ඩ ඉවතට ගෙන හොඳ නිමාවට පත් වූ මැටි භාණ්ඩ භාවිතය සඳහා ඉදිරිපත් කරනු ලැබේ.

කැල්ල කුඹල් ගම්මානයේ මෘද් භාණ්ඩ ශිල්පීය විධි වර්තමානය වන විටත් සාම්ප්‍රදායික මට්ටමින් පවත්වා ගනු ලබන බවත් එහිදී ඔවුන් භාණ්ඩ නිශ්පාදනයේ දී ශිල්පීය විධි උපරිම මට්ටමින් භාවිතා කර ඇති බවටත් වර්තමානයේ වන විට එම ශිල්පියා විධි වැඩි දියුණු කරමින් අලංකරණයත් ලෙස මෘද භාණ්ඩ ශිල්පය පවත්වා ගෙන යන බවටත් ඒ සඳහා අමුද්‍රව්‍ය සපයා ගැනීමේ දී විවිධ ගැටලුවලට මුහුණපෑමට සිදු වී ඇති බවටත් අවසාන වශයෙන් නිගමනය කළ හැකිය.

### ආශ්‍රිත ග්‍රන්ථ


දෙල්පාගොඩ, ජයවීර (2012) ***අපේ දේශීය කර්මාන්ත උරුමය,*** සමගි ප්‍රින්ට් හවුස් ඇන්ඩ් පබ්ලිෂර්ස්, මීගමුව

ප්‍රනාන්දු පී රෝහණ (2010) ***කුඹල් ප්‍රජාව සහ මැටි කර්මාන්තය***, සමයවර්ධන පොත්හල (පෞද්ගලික සමාගම, කොළඹ 10

සංස්කෘතික දෙපාර්තමේන්තුව (1962) ***මධ්‍යකාලීන සිංහල කලා,*** රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව, කොළඹ 02